**ශීර්ෂය 56 - විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය**
---------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**
-----------------------------

විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ඔක්තෝබර් 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 පෙබරවාරි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
---------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ශීර්ෂය 56 - විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය 2019 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අමාත්‍යාංශයක් වන බැවින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව තහවුරු කළ නොහැකි විය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැරව වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(vi) ඡේදය ප්‍රකාරව අග්‍රිම ගැලැපුම් ගිණුම මගින් ගැලැපිය යුතු කරුණු සඳහන් කර තිබුණද, ඊට පටහැනිව රු.483,500 ක් වූ හරස් සටහන් වියදම්ද, අධිභාර රු.1,537,549 ක්ද එහි දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 ප්‍රකාරව ගිණුම් පිළියෙල කල යුතුවීම. | මුළු වියදම තුල හරස් සටහන් ඇතුලත වන බැවින්, ඒවා ගැලපීම් කිරීමට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුල අවකාශ නොමැත. එම නිසා අක් මුදල් ගැලපීම් ගිණුම තුල ඒවා සටහන් කිරීමට සිදුවූ බවත්, අග්‍රිම පියවීමද එසේ සටහන් කිරීමට සිදුවූ බවත්, මුළු වියදම ගෙන ඇත්තේ අධිභාර නොගැලපූ වටිනාකම් නිසා අධිභාර වටිනාකම ගැලපීම් ගිණුමේ දක්වා ඇති බව. |
| (ආ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඒසීඒ-සී ආකෘතිය පාදක කර ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වුවත්, ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය එම ආකෘතියට අනුකූල වී නොතිබුණි. | -එම- | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ තිබූ ආකෘතිය යොදා ගන්නා ලද බව. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශයේ තැන්පත් ලැබීම් හා අත්තිකාරම් ලැබීම් පිළිවෙලින් රු.106,786 ක් හා රු.147,669 ක් වුවත් එම වටිනාකම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ලැබීම් ලෙස දක්වා නොතිබුණි. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමේ අවශ්‍යතාවය | "මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හැකිතාක් මුදලින් සිදු කරන ලද ගණුදෙනු පමණක් ඇතුලත් කල යුතුය" යන පදනම මත සකස්කල බවත්, අත්තිකාරම් හා තැන්පතු ලැබීම් රු.254,445 ක් හරස් සටහන් බැවින් ඒවා ඇතුලත් නොකරන ලද බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙනත් ලැබීම් වටිනාකම රු.242,325 ක් වුවද එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි රු.1,564,799 ක් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.1,322,474 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | විගණන නිරීක්ෂණය පිළිනොගන්නා බවත් භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ (SA – 21) අනුව පැහැදිලිවම අනෙකුත් අග්‍රිම ලැබීම් වටිනාකම රු.1,564,799 ක් ලෙස දක්වා ඇති බවත් මූල්‍ය කාර්ය සාධනයේ දක්වා ඇති අග්‍රිම ලැබීම් වටිනාකම භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ (SA – 70) සමඟ තුලනය වන බව පැහැදිලිව පෙන්නුම් කරන බව. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශ
--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ------------------------------ |
| (අ) | මුදල් ප්‍රවාහය යටතේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කර තිබුණු රු.242,325 ක ලැබීම් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | ආදායම් නොවන ලැබීම් යටතේ කාණ්ඩ වෙන් කර නොමැති නිසා මුළු එකතුව සටහන් කර ඇති බව. |
| (ආ) | පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.49,974,698 ක් වුවද එය රු.96,873,922 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්වීම හේතුවෙන් රු.46,899,224 ක මුදල් ගලා යාම වැඩිපුර දක්වා තිබුණි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සැකසීමේ අවශ්‍යතාවය | මුදල් ප්‍රවාහ ප්‍රකාශ තුල පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යන අයිතමය යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් එකතුව සටහන් කරන ලද බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් අයකර ගෙන තිබුණු රු.541,091 ක වටිනාකමද අත්තිකාරම් ලෙස ගෙවන ලද රු.706,702 ක වටිනාකමද භෞතික වත්කම් ඉදිකිරිම හෝ මිලදී ගැනීම හෝ වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් සඳහා රු.27,474,506 ක ගෙවීම්ද ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ සඳහන් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 271/2019 ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය | ආයෝජන කියාකාරකම් සිදු නොවූ බැවින් එහි වටිනාකම ඇතුලත් කර නොමැති බව. |

### 1.6.4 අග්‍රිම ගිණුම්

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.17,838,757 ක් විය යුතුව තිබුණත්, එම ශේෂය රු. 19,386,269 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.1,547,512 ක් වැඩිපුර දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමේ අවශ්‍යතාවය | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. |
| (ආ) | අමාත්‍යාංශයේ ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම්, සහ භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශන වල සඳහන් වටිනාකම් අතර රු.464,614 ක වෙනසක් පැවැතුණත්, එය අග්‍රිම ගැලපුම් ගිණුමේ සඳහන් කර නොතිබුණි. | දෙපාර්තමේන්තු පොත්වල ශේෂ භාණ්ඩාගාරය සමඟ සැසඳීමේ අවශ්‍යතාවය | වර්ෂය අවසානයේදී අත්තිකාරම් ශේෂ පවරා ගැනීම මාරු පත් මගින් භාණ්ඩාගාර වෙත ඉදිරිපත් කිරීම නිසා ශේෂ පිරික්සුම හා භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අතර වෙනස ඇති වී ඇති බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.29,730,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය | අනුමත කාර්ය මණ්ඩලය 42 ක් වූ නමුත් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වූයේ සේවකයන් 15 ක් පමණක් වූ අතර සේවකයන් ලෙස යොදා ගනු ලැබුවේ උපාධිධාරී පුහුණු නිලධාරීන් බව. |
| (ආ) | වැය විෂයයන් 12 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය, සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 35 ක සිට සියයට 88 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | අමාත්‍යාංශය ගැසට් පත්‍රයක් මගින් ස්ථාපිත කලේ 2019 මාර්තු මස දී වූ අතර, 2019 නොවැම්බර් 20 දින නැවත එය වසා දැමීම හේතුවෙන්, කාර්යයන් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. එසේම අඩු කාර්ය මණ්ඩලයක් නිසාද කාර්යයන් කිරීමේ ප්‍රමාදයක් ඇති වුණි. |